# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1717/20 - 2011 අගෝස්තු 04 වැනි බ්‍රහස්පතින්දා - 2011.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2004 අංක 11 දරන මුදල් පනත**

26 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2009 සැප්තැම්බර් මස 22 වැනි දින අංක 1620/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගවල 9 වැනි නියෝගය ඉවත් කොට එතැනට පහත නියෝගය ආදේශ කරමි.

මහින්ද රාජපක්ෂ,<br>
ජනාධිපති,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011ක් වූ ජූලි මස 27 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

9. සෑම දේශීය පොදු දුරකථන පුවරු ජාල (දේ.පො.දු.පු.ජා.) ක්‍රියාකරුවකු විසින්ම කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ දුරකථන සේවා නොමැති හෝ අඩු ප්‍රදේශවල විදුලි සංදේශ ජාලය සංවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ සංවර්ධන ගාස්තු වලින් තුනෙන් දෙකක් ඉල්ලා සිටිය හැක. එක් එක් දේ.පො.දු.පු.ජා. ක්‍රියාකරුවකුට ඔවුන්ගේ නමින් ගෙවීම් කළ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවට පමණක් හිමිකම්පෑම කළ හැකිය. යම් වර්ෂයක විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවේ තුනෙන් දෙකක ප්‍රමාණය සඳහා අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් තුල හිමිකම්පෑමට එවැනි යම් දේ.පො.දු.පු.ජා. ක්‍රියාකරුවකුම සුදුසුකම් ලබනු ඇත. එසේ වුවද පහත උපලේඛනයේ II තීරුවේ දක්වා ඇති යම් කාලපරිච්ඡේදයක් සම්බන්ධයෙන් වන විටදී එවැනි යම් ක්‍රියාකරුවෙකුට උපලේඛනයේ III වැනි තීරුවේ එයට අනුරූපව දක්වා ඇති දිනය දක්වා හිමිකම් පෑමට සුදුසුකම් ලැබේ.

| I<br>වර්ෂය | II<br>කාල පරිච්ඡේදය | III<br>හිමිකම්පෑම කළ හැකි අවසන් දිනය | IV<br>ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළයුතු අවසාන දිනය |
|---|---|---|---|
| 2006 | 2006.04.01 - 2007.03.31 | 2010.09.30 | 2011.09.30 |
| 2007 | 2007.04.01 - 2008.03.31 | 2010.12.31 | 2011.12.31 |
| 2008 | 2008.04.01 - 2009.03.31 | 2012.03.31 | 2013.03.31 |
| 2009 | 2009.04.01 - 2010.03.31 | 2013.03.31 | 2014.03.31 |
| 2010 | 2010.04.01 - 2010.12.31 | 2013.12.31 | 2014.12.31 |

තවද 18 වැනි නියෝගයේ කුමක් සඳහන් වුවද ඉහත සඳහන් උපලේඛනයේ II තීරුවේ දක්වා ඇති යම් කාලපරිච්ඡේදයකදී එකතු කළ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවේ බෙදා හරිනු නොලැබූ යම් මුදලක් උපලේඛනයේ IV වැනි තීරුවේ එයට අනුරූපව දක්වා ඇති දිනයේ දී හෝ එදිනට ප්‍රථම ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුය.

08-489